**<u>සියලුම ඇගයීම් පරීක්ෂක අයදුම්කරුවන් සඳහා අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්</u>**

ඉතා වැදගත් :- *** ඉල්ලා ඇති සියලු තොරතුරු නිවැරදිව සම්පූර්ණයෙන් සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
*** සියලු ම අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍රවල මුද්‍රිත පිටපතක් විභාග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.**

01. අංක 03 (01) 2009 හා 2011.03.01 දිනැති සංශෝධිත චක්‍රලේඛයෙහි උපදෙස් අනුගමනය කළ යුතු ය.

1.1 පහත සඳහන් සුදුසුකම් සපුරාලන, දැනට අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති පාසල්වල සේවයේ නියුතු ගුරුභවතුන්ට සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් සම්බන්ධව පළපුරුද්ද සහිත ගුරු උපදේශකවරුන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකි ය.

(අ) ඉල්ලුම් කරන ලද විෂයය උපාධියට හෝ ඩිප්ලෝමාවට හදාරා තිබීම සහ එම විෂයට අදාළව ගුරුවරයෙකු ලෙස විධිමත් පත්වීමක් ලබා තිබීම.

(ආ) අ.පො.ස. (උ/පෙළ) (12, 13 ශ්‍රේණිවලට) ගුරුවරයෙකු ලෙස ඉගැන්වීමේ කටයුතු වල නිරතවීම හෝ නිලධාරියෙකු ලෙස අ.පො.ස. (උ/පෙළ) විෂය නිර්දේශ වලට අදාළ රාජකාරිවල නිරතවීම.

* විද්‍යා විෂය ඉංග්‍රීසි මාධ්‍යය සහ (73) ඉංග්‍රීසි විෂය සඳහා නියමිත සුදුසුකම් සහිත, දේශීය විෂය නිර්දේශය උගන්වන, පෞද්ගලික හෝ ජාත්‍යාන්තර පාසල්වල ගුරුභවතුන්ට ද අයදුම් කළ හැකි ය.

1.2 අංක 10 සම්පූර්ණ කිරීමේ දී ඉල්ලුම්කරන ලද විෂයට අදාළ සුදුසුකම් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. එසේ සඳහන් කිරීමට අපොහොසත් වන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.3 අංක 13 සහ 14 ඡේද සම්පූර්ණ කිරීමේ දී ''ඔව්'' (Yes) හෝ ''නැත''(No) යන්න අදාළ කොටුව තුළ පැහැදිළිව සටහන් කරන්න. එසේ සම්පූර්ණ නොකරන ලද ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

* දැනට ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වේ නම් හෝ ඔබ විභාග තහනමකට ලක්වූ අයකු නම් හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ නොහැකි ය.

1.4 ඔබ හෝ ඔබගේ පවුලේ සාමාජිකයෙකු විභාගයට ඉදිරිපත් වේ නම් ඔබට ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ නොහැකිය. පවුලේ සාමාජිකයකු යනුවෙන් අදහස් කරන්නේ ඔබගේ දරුවන් හෝ දරුවන්ගේ දරුවන් හෝ ඔබගේ හෝ කලත්‍රයාගේ දෙමාපියන් හෝ සොයුරු සොයුරියන් හෝ ඔවුන්ගේ දරුවන් හෝ ඔබගේ නේවාසිකයන් වේ.

1.5 විෂයයන් දෙකක් සඳහා අයදුම්කළ හැක්කේ පහත සඳහන් විෂය සංයෝජනයන් සඳහා පමණි.

| | | |
|---|---|---|
| **(10) සංයුක්ත ගණිතය** | **(02) රසායන විද්‍යාව** | **(08) කෘෂි විද්‍යාව** |
| (11) උසස් ගණිතය | (67) තාක්ෂණවේදය සඳහා විද්‍යාව | (18) කෘෂි තාක්ෂණවේදය |
| (07) ගණිතය | | (66) ජෛව පද්ධති තාක්ෂණවේදය |

**(65) ඉංජිනේරු තාක්ෂණවේදය**
(14) සිවිල් තාක්ෂණවේදය
(15) යාන්ත්‍රික තාක්ෂණවේදය
(16) විදුලිය,ඉලෙක්ට්‍රොනික සහ තොරතුරු තාක්ෂණවේදය

1.6 සියලුම අයදුම්කරුවන් මෙම ආකෘතියේ 16 ඡේදය හැර ඉතිරි සියල්ල මාර්ගගත ක්‍රමයට (online) සම්පූර්ණ කර එහි PDF පිටපත බාගත (Download) කර විදුහල්පතිට/ ආයතන ප්‍රධානියාට භාරදිය යුතුය. නවක අයදුම්කරුවන් අදාළ සහතිකවල, සහතික කළ පිටපත් සමඟ විදුහල්පතිට/ ආයතන ප්‍රධානියාට භාරදිය යුතුය.

1.7 ඉල්ලුම්පත්‍ර යොමුකළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. රජයේ පාසල් ගුරුවරුන්ගේ ඉල්ලුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට (Online) විදුහල්පති විසින් නිර්දේශ කර මාර්ගගත ක්‍රමයට (Online) මෙම දෙපාර්තමේන්තුවට එවිය යුතු අතර, <u>මුද්‍රිත පිටපත විදුහල්පති/ ආයතන ප්‍රධානියා විසින් සහතික කර දෙපාර්තමේන්තුවට එවිය යුතුය</u>. (නවක අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කරන සහතිකවල සහතික කරන ලද පිටපත් ද අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය).

1.8 පූර්වෝක්ත විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් මධ්‍යස්ථාන පහත දක්වා ඇති ස්ථානවල පිහිටුවීමට යෝජිත ය. (ඇගයීම් කාලසීමාව දින 14 ක් පමණ වේ.)

| | | |
|---|---|---|
| 01. කොළඹ | 15. රත්නපුරය | 35. අනුරාධපුරය |
| 02. මහරගම | 20. බදුල්ල | 38. කෑගල්ල |
| 08. හොරණ | 25. ගාල්ල | 41. මහනුවර |
| 10. කළුතර | 27. මාතර | 50. මඩකලපුව |
| 12. මීගමුව | 30. කුරුණෑගල | 51. වවුනියාව |
| 13. ගම්පහ | 32. කුලියාපිටිය | 53. යාපනය |

**සැ.යු.** * **ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබෙන නගරවල ඇගයීම් මධ්‍යස්ථාන පිහිටුවනු නොලැබේ. එබැවින් දෙවන කැමැත්ත ද සඳහන් කළ යුතු ය.**

* **උත්තර පත්‍ර ඇගයීම් කරන කාලය තුළ විභාග දෙපාර්තමේන්තුව මගින් නවාතැන් පහසුකම්, ප්‍රවාහන පහසුකම් හෝ මුදල් අත්තිකාරම් සපයනු නොලැබේ.**

**02.** අයදුම්පත සහතික කිරීම,

ගුරුවරුන්ගේ අයදුම්පත් විදුහල්පති විසින් ද, කලාප කාර්යාලවලට අනුයුක්ත ගුරු උපදේශකවරුන්ගේ අයදුම්පත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද කොට්ඨාස කාර්යාලවලට අනුයුක්ත ගුරු උපදේශකවරුන්ගේ අයදුම්පත්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද පෞද්ගලික හා ජාත්‍යාන්තර පාසල්වල ගුරුවරුන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියා විසින්ද සහතික කළ යුතු ය.

**03. අයදුම්පත සහතික කිරීම සඳහා උපදෙස් (විදුහල්පති / ආයතන ප්‍රධානියා)**

3.1 අයදුම්කරු මෙම ආකෘතියේ සඳහන් කරන ලද තොරතුරු නිවැරදිදැයි ඔබ විසින් පරීක්ෂාකාරීව කියවා බැලිය යුතුය.

3.2 ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව 3 වන පිටුවේ අදාළ ස්ථානයෙහි අනිවාර්යයෙන් ම සහතික කළ යුතුය.

3.3 ඉහත අංක 16 (a) (i) සිට (iv) දක්වා ඇති කරුණු යටතේ අයදුම්කරු පිළිබඳ ව ඔබේ තක්සේරුව අදාළ කොටුව තුළ නියමිත අක්ෂරය සටහන් කිරීමෙන් දැක්විය යුතුය.

A - විශිෂ්ටයි B - හොඳයි C - සාමාන්‍යයි W - දුර්වලයි

3.4 මෙය රහස්‍ය වාර්තාවකි. සියලුම අයදුම්පත් ඔබ විසින් මාර්ගගත ක්‍රමයට (Online) දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතුය.

01. එසේම බාගත කර (Downloaded) සම්පූර්ණ කරන ලද සියලුම ඉල්ලුම්පත්‍ර සහතික කිරීමෙන් පසු උපලේඛනගත කර (නවක අයදුම්කරුවන්ගේ නම් අදාළ ඇමුණුම් ද සහිතව) තම කාර්යාලයේ සුරක්ෂිතව තබාගත යුතුය.

02. එසේම නවක සහ පාසල් ගුරුවරුන් නොවන අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර ඇමුණුම් සහිතව ද අනෙකුත් අයදුම්කරුවන්ගේ (පැරණි පරීක්ෂකවරුන්ගේ) අයදුම්පත්‍ර ඇමුණුම් රහිතව ද ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''උත්තරපත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා අයදුම්පත්‍ර, අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2025''** ලෙස සඳහන් කර පහත ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.

සියලුම අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනය 2025.09.10 බව සලකන්න.

**විභාග කොමසාරිස් ජනරාල්**
**පාසල් විභාග ඇගයීම් ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 1503,**
**කොළඹ.**

**ඇමුණුම**

අයදුම් කිරීමට අපේක්ෂිත විෂයන් පහත අදියරයන් අනුව තෝරා ගැනීමට කටයුතු කරන්න.

**1st Stage**

| | |
|---|---|
| 1 | Physics (S/T/E) |
| 8 | Agricultural Science (S/T) |
| 9 | Biology (S/T/E) |
| 10 | Combined Mathematics (S/T) |
| 14 | Civil Technology (S/T/E) |
| 15 | Mechanical Technology (S/T/E) |
| 16 | Electrical, Electronic & Inf. Tec. (S/T/E) |
| 17 | Food Technology (S/T/E) |
| 18 | Agro Technology (S/T/E) |
| 19 | Bio-Resource Technology (S/T/E) |
| 21 | Economics (S/T/E) |
| 24 | Logic & Scientific Method (S/T/E) |
| 28 | Home Economics (S/T/E) |
| 31 | Business Statistics (S/T/E) |
| 32 | Business Studies (S/T/E) |
| 41 | Buddhism (S/T/E) |
| 42 | Hinduism (S/T/E) |
| 43 | Christianity (S/T/E) |
| 44 | Islam (S/T/E) |
| 45 | Buddhist Civilization (S/T/E) |
| 46 | Hindu Civilization (S/T/E) |
| 47 | Islam Civilization (S/T/E) |
| 49 | Christian Civilization (S/T/E) |
| 51 | Art (S/T/E) |
| 52 | Dancing (Indigenous) (S) |
| 53 | Dancing (Bharatha) (S/T) |
| 54 | Oriental Music (S) |
| 55 | Carnatic Music (X) |
| 56 | Western Music (X) |
| 57 | Drama & Theatre (S) |
| 58 | Drama & Theatre (T) |
| 59 | Drama & Theatre (E) |
| 67 | Science for Technology (S/T/E) |
| 71 | Sinhala (X) |
| 72 | Tamil (X) |
| 73 | English (X) |
| 74 | Pali (X) |
| 75 | Sanskrit (X) |
| 78 | Arabic (X) |
| 82 | German (X) |

**2nd Stage**

| | |
|---|---|
| 2 | Chemistry (S/T/E) |
| 7 | Mathematics (S/T/E) |
| 8 | Agricultural Science (E) |
| 10 | Combined Mathematics (E) |
| 11 | Higher Mathematics (S/T/E) |
| 13 | General English (X) |
| 20 | Information & Communication T. (S/T/E) |
| 22 | Geography (S/T/E) |
| 23 | Political Science (S/T/E) |
| 25 | History of Sri Lanka (S/T/E) |
| 25 A | History of India (S/T/E) |
| 25 B | History of Europe (S/T/E) |
| 25 C | History of Modern World (S/T/E) |
| 29 | Communication & Media Stu. (S/T/E) |
| 33 | Accounting (S/T/E) |
| 48 | Greek & Roman Civilization (X) |
| 65 | Engineering Technology (S/T/E) |
| 66 | Bio Systems Technology (S/T/E) |
| 79 | Malay (X) |
| 81 | French (X) |
| 83 | Russian (X) |
| 84 | Hindi (X) |
| 86 | Chinese (X) |
| 87 | Japanese (X) |
| 88 | Korean (X) |

- අයදුම්පතේ දෘඩ පිටපතක් විදුහල්පති මගින් සනාථ කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග ඇගයීම් ශාඛාව වෙත එවිය යුතුය.
- ප්‍රධාන විෂයට අමතරව දෙවන විෂයක හෝ මාධ්‍යයක පිළිතුරුපත්‍ර ලකුණු කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා ද ඔබ විසින් බාගත කරන ලද දෘඪ පිටපතේ ඡායා පිටපත් කර එහි දෙවන මාධ්‍ය/ දෙවන විෂය Highlight කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට එවිය යුතුය.
- දෙවන අදියරේ විෂයයන්ගේ ඉංග්‍රීසි මාධ්‍ය පිළිතුරු පත්‍ර ලකුණු කිරීමට අපේක්ෂා කරන්නේ නම් ද අයදුම්පත්‍රයේ දෘඪ පිටපත් එවිය යුතුය.